
# 19. අපි ජේසුගේ ගෝලයෝ වෙමු

දවසක් ජේසුතුමා ගලීලයේ මුහුද ළඟට ගියා. එතැන දී සෙනඟට දෙවි පියා ගැන කියා දුන්නා.

ඉන් පසු එතැන සිටි සීමොන් පේදුරු නම් තැනැත්තාට කතා කර 'විල මැදට ගොස් මාළු ඇල්ලීම සඳහා දැල දමන්න' කියා කීවා. එවිට ඔහු දැල එළුවා. දැන් දැල ඉරෙන්න තරම් මාළු පිරිලා. තවත් ඔරුවකින් උදවු දීමට ආවා. දැන් ඔරු දෙක ම මාළුන්ගෙන් පිරිලා.

සීමොන් ජේසුතුමා ළඟ වැඳ වැටී මෙලෙස කීවා.

'ස්වාමීනි, මා වෙතින් ඉවත් වන්න. මම පව්කාර මිනිසෙක්'. එවිට ජේසුතුමා කතා කොට 'බිය වෙන්න එපා. මෙතැන් සිට ඔබ මිනිසුන් දිනා ගන්නවා' යැයි පැවසුවා.



ජේසුතුමාගේ ගෝලයන් වන්නට ඔරු දෙකේ ම සිටි අයට ආශාවක් ඇති වුණා. සියලු දෙනා ම ජේසුතුමා පසු පස ගියා. ජේසුතුමාගෙන් බොහෝ දේ ඉගෙන ගත්තා. ජේසුතුමා මේ අය ගැන බොහෝ සතුටු වුණා